පිළියන්දල අධ්‍යාපන කලාපය

**Education Zone - Piliyandala**

වර්ෂ මැද ඇගයීම - 2017

**Mid Year Evaluation**

| ශ්‍රේණිය Grade | 07 | විෂයය Subject | බුද්ධ ධර්මය | පත්‍රය Paper | I | කාලය Time | පැය 02යි |
|---|---|---|---|---|---|---|---|

නම .............................................. විභාග අංකය .......................

සැළකිය යුතුයි:

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 20 තෙක් ප්‍රශ්නවල දී ඇති පිළිතුරු වලින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01) විසි දහසක් රහතන් වහන්සේලා පිරිවරාගෙන බුදුරජාණන් වහන්සේ කිඹුල්වත් පුර ගමන ආරම්භ කලේ,

1. නවම් පුර පසළොස්වක පෝයදා වේ.
2. මැදින් පුර පසළොස්වක පෝය දා වේ.
3. බක් පුර පසළොස්වක පෝයදා වේ.
4. වෙසක් පුර පසළොස්වක පෝයදා වේ.

02) බුදුරජාණන් වහන්සේ ඥාති ප්‍රේත පිරිසට පින් අනුමෝදන් කිරීමේ වැදගත්කම පෙන්වා දෙමින් දේශනා කළ සූත්‍රය වන්නේ,

1. කරණීයමෙත්ත සූත්‍රය.
2. තිරෝකුඩ්ඩ සූත්‍රය.
3. සිඟාලෝවාද සූත්‍රය.
4. මහා මංගල සූත්‍රය .

03) බුද්ධ ශාසනයේ ප්‍රථම ආරාම පූජාව සිදුකරන ලද්දේ,

1. සුද්ධෝදන රජතුමාය.
2. බිම්බිසාර රජතුමාය.
3. කොසොල් රජතුමාය.
4. සුප්‍රබුද්ධ රජතුමාය.

04) බුදුරජාණන් වහන්සේගේ අනන්ත බුදු ගුණ සිහි කරමින් වඩන ලද භාවනාව,

1. බුද්ධානුස්සති නම් වේ.
2. ධම්මානුස්සති නම් වේ.
3. සංඝානුස්සති නම් වේ.
4. දේවානුස්සති නම් වේ.

05) සිරිත් විරිත් පිළිබඳ පැහැදිලි කරමින් තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් විසින් රචනා කරන ලද රචනා කල කාව්‍ය ග්‍රන්ථය වන්නේ,

1. සිරිත් මල්දම යි.
2. සුභාෂිතය යි.
3. කාව්‍යශේඛරය යි.
4. ලෝ වැඩ සඟරාව යි.

06) දහස් ගණනක් සූත්‍ර දේශනා අතර තුන් සූත්‍රයට අයත් නොවන්නේ,

1. මහා මංගල සූත්‍රය.
2. රතන සූත්‍රය.
3. කරණීයමෙත්ත සූත්‍රය.
4. සිඟාලෝවාද සූත්‍රය.

07) බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝරත්නයට ජේතවනාරාමය සාංඝික කොට පූජා කරන ලද්දේ,

1. ධනංජය සිටුතුමාය.
2. මිගාර සිටුතුමාය.
3. සුදත්ත සිටුතුමාය.
4. පූර්ණවර්ධන සිටුතුමාය.

08) බෞද්ධයාගේ අත්පොත ලෙස සැළකෙන ධම්ම පදය අයත් වන්නේ,

1. සුත්‍ර පිටකයේ දීඝ නිකායටය.
2. සුත්‍ර පිටකයේ මජ්ඣිම නිකායටය.
3. සුත්‍ර පිටකයේ අංගුත්තර නිකායටය.
4. සුත්‍ර පිටකයේ ඛුද්දක නිකායටය.

09) සමාජයක යහපත් පැවැත්ම සඳහා නිවැරදිව අදහස් හුවමාරුකරගැනීම ඉතා වැදගත් වේ. මේ සඳහා අප විසින් ආරක්ෂා කල යුත්තේ පංචශීලයේ,

1. පළමුවන සිල්පදය
2. දෙවන සිල්පදය
3. තුන්වන සිල්පදය
4. හතරවන සිල්පදය

10) " පිසුණාවාචා වේරමණී සික්ඛාපදං සමාදියාමි " යන සිල්පදයේ තේරුම වන්නේ,

1. මම මුසාබස් කීමෙන් වැළකීමේ සිල්පදය සමාදන් වෙමි යන්නයි.
2. මම කේළම් කීමෙන් වැළකීමේ සිල්පදය සමාදන් වෙමි යන්නයි.
3. මම රළුවචන කීමෙන් වැළකීමේ සිල්පදය සමාදන් වෙමි යන්නයි.
4. මම හිස්වචන කීමෙන් වැළකීමේ සිල්පදය සමාදන් වෙමි යන්නයි.

11) ජීවිතය ජය ගන්නා ආකාරය අපට පෙන්වා දෙන ගුරුවරුන් උපමා කර ඇත්තේ,

1. නැගෙනහිර දිශාවට ය.
2. බටහිර දිශාවට ය.
3. දකුණු දිශාවට ය.
4. උතුරු දිශාවට ය.

12) සම්මා සම්බුදු රජාණන් වහන්සේ එසමයෙහි නුවණැති සාත්තු නායකයාව ඉපිද සිටියේ ,

1. නලපාන ජාතකයෙහි ය.
2. අපණ්ණක ජාතකයෙහි ය.
3. වෙස්සන්තර ජාතකයෙහි ය.
4. සඳකිඳුරු ජාතකයෙහි ය.

13) සියලු කලකෝලාහල සංසිඳුවාගෙන නිතර සුවසේ කල්ගත කිරීමට අප විසින් පුහුණු කළ යුත්තේ,

1. ඉවසීම ය.
2. උත්සහයය.
3. නීරෝගිකමය.
4. කරුණාවය.

14) තමන්වහන්සේට ගුරුවරයෙකු නොමැති නිසා ධර්මය ගුරු තන්හි තබා ගැනීමට බුදුරජාණන් වහන්සේ තීරණය කළේ,

1. තෙවන සතියේදී ය.
2. සිව්වන සතියේදී ය.
3. පස්වන සතියේදීය.
4. හයවන සතියේදී ය.

15) තෙරුවන් සරණ ගිය පළමු උපාසකයා බවට පත් වූයේ ,

1. අනේපිඬු සිටුතුමා ය.
2. බරණැස් සිටුතුමා ය.
3. ධනංජය සිටුතුමා ය.
4. මිගාර සිටුතුමා ය.

16) කරණීයමෙත්ත සූත්‍රයේ දක්වන සියලු සත්ත්වයෝ අතර " දීඝා " ලෙස හඳුන්වන්නේ,

1. තැතිගන්නා සුලු සත්ත්වයෝ ය.
2. තැතිනොගන්නා සත්ත්වයෝ ය.
3. දික්වූ ශරීර ඇති සත්ත්වයෝ ය.
4. විශාල ශරීර ඇති සත්ත්වයෝ ය.

17) පස්වග මහණුන් රහතන් වහන්සේලා බවට පත්වූයේ බුදුරජාණන් වහන්සේ දේශනාකළ,

1. අනන්ත ලක්ඛන සූත්‍ර දේශනාව අසාය
2. දම්සක් පැවතුම් සූත්‍ර දේශනාව අසාය.
3. මහා මංගල සූත්‍ර දේශනාව අසාය
4. රතන සූත්‍ර දේශනාව අසාය

18) ඔබ අනන්ත ජින දැයි බුදු රජාණන් වහන්සේගෙන් විමසුවේ,

1. සංජය පිරිවැජියාය
2. උපක ආජීවකය
3. උරුවෙල කාශ්‍යපය
4. ගයා කාශ්‍යපය

19) රෝගීන්ට උපස්ථාන කරන උපස්ථායකයකු තුළ තිබිය යුතු ගුණාංගයක් නොවන්නේ,

1. රෝගියාට අවශ්‍ය බෙහෙත් පිළියෙල කර දීමය.
2. ලාභ ප්‍රයෝජන අපේක්ෂාවෙන් කටයුතු කිරීමය.
3. රෝගියාගේ සිත සැනසෙන ලෙස කතා කිරීමය.
4. මල, මුත්‍ර ආදිය කෙරෙහි පිළිකුල් නොවීමය.

20) බෝසතාණන් වහන්සේ පාරමිතා ධර්ම සම්පූර්ණ කළ කාලය තුළ කඩ නොකරමින් සුරැකි ප්‍රතිපත්තිය වූයේ,

1. ප්‍රාණ ඝාතයෙන් වැළකීමය.
2. අදින්නාදානයෙන් වැළකීමය.
3. බොරුවෙන් වැළකීමය.
4. සුරා පානයෙන් වැළකීමය

| පිළියන්දල අධ්‍යාපන කලාපය<br>Education Zone - Piliyandala | | | |
|---|---|---|---|
| වර්ෂ මැද ඇගයීම - 2017<br>Mid Year Evaluation | | | |
| ශ්‍රේණිය<br>Grade } 07 | විෂයය<br>Subject } බුද්ධ ධර්මය | පත්‍රය<br>Paper } II | |

**සැළකිය යුතුයි:**

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු ලියන්න.
- පළමු ප්‍රශ්නය සඳහා ලකුණු 16කි.
- අනෙකුත් ප්‍රශ්න සඳහා ලකුණු 11 බැගිනි.

01) **සිසු නිර්මාණ එකතුව ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

1. නිර්මාණ එකතුව සඳහා ඔබ ඉදිරිපත් කරන ලද නිර්මාණය නම් කරන්න.
( ලකුණු 02 )

2. ඔබේ නිර්මාණයට තොරතුරු එකතු කරගත් ක්‍රම දෙකක් සඳහන් කරන්න.
( ලකුණු 02 )

3. ඔබේ නිර්මාණය සකස් කිරීමේදී මුහුණදීමට සිදුවූ ගැටළු දෙකක් ලියන්න.
( ලකුණු 02 )

4. සිසු නිර්මාණය තුලින් ඔබ ලැබූ අත්දැකීම් දෙකක් ලියන්න.
( ලකුණු 02 )

5. සිසුන් වශයෙන් ඔබගෙන් ගුරුභවතුන් වෙත ඉටුවිය යුතු යුතුකම් පහකි. එයින් දෙකක් ලියා දක්වන්න.
( ලකුණු 02 )

6. පංච සීලයට අනුව ජීවත් වීම සමාජ සාරධර්ම සුරැකීමට ප්‍රබල සාධකයකි. පැහැදිලි කරන්න
( ලකුණු 06 )

02) 1. ගිහි බෞද්ධ ජනතාව පුර පසළොස්වක පොහෝ දිනයන්හි සමාදන් වන විශේෂ සීල ප්‍රභේද දෙක නම් කරන්න. ( ලකුණු 02 )

2. ආජීව අෂ්ටමක සීලයට අයත් විශේෂ සිල්පද හතරක් ලියන්න. ( ලකුණු 04 )

3. දරුවන් සිල්වත් වීමෙන් පන්ති කාමරය තුළ දක්නට ලැබෙන වෙනස්කම් පිළිබඳ විස්තරයක් කරන්න. ( ලකුණු 05 )

03) 1. ගුරු ශිෂ්‍ය යුතුකම් පිළිබඳ විස්තර කරන සූත්‍රය කුමක්ද? ( ලකුණු 02 )

2. ගුරුවරයාගෙන් ශිෂ්‍යයාට ඉටුවිය යුතු යුතුකම් හතරක් ලියන්න. ( ලකුණු 04 )

3. ශිෂ්‍යයාගෙන් ගුරුවරයාට ඉටුවිය යුතු යුතුකම් පිළිබඳ විස්තරයක් කරන්න.( ලකුණු 05 )

04) 1. බුද්ධ චරිතයේ උතුම් ඉවසීමේ ගුණය ප්‍රකට කරන අවස්ථා දෙකක් නම් කරන්න. ( ලකුණු 02 )

2. බුද්ධ කාරක ධර්මයක් වන ඛන්ති පාරමිතාව ගැන කෙටි හැඳින්වීමක් කරන්න. ( ලකුණු 04 )

3. බුදුරජාණන් වහන්සේ දේශනා කළ ඉවසීමෙන් ලැබෙන ආනිසංස පිළිබඳ විස්තරයක් කරන්න. ( ලකුණු 05 )

05) 1. සහජීවනය යන පදය හඳුන්වන්න ( ලකුණු 02 )

2. සමාජය තුළ සහජීවනයෙන් කටයුතු කරන ආකාරය දැකිය හැකි අවස්ථාවන් හතරක් ලියන්න. ( ලකුණු 04 )

3. සමාජය තුළ සාමය, සමගිය ගොඩනගා ගැනීමට සහජීවනයෙන් කටයුතු කිරීමේ වැදගත්කම පැහැදිලි කරන්න. ( ලකුණු 05 )

06) 1. බුදු සසුනේ අග්‍රදායිකාව නම් කරන්න ( ලකුණු 02 )

2. එතුමියගෙන් බුදු සසුනට ඉටු වූ සේවාවන් හතරක් සඳහන් කරන්න. ( ලකුණු 04 )

3. ඇයගේ චරිතයෙන් තම ජීවිතය ගොඩනගා ගැනිමට ගතහැකි ආදර්ශ පහක් ලියන්න. ( ලකුණු 05 )

07) 1. A, B කොටස් වලින් එක මාතෘකාව බැගින් තෝරාගෙන මාතෘකා දෙකකට කෙටි සටහන් ලියන්න. ( ලකුණු 11 )

| <u>A කොටස(ල. 6)</u> | | <u>B කොටස(ල.5)</u> | |
|---|---|---|---|
| 1 | කළගුණ සැළකීම | 2 | අනේපිඬු සිටුතුමා |
| 1 | වැඩිහිටියන්ට සැළකීම | 2 | සුනාපරන්ත වාසි පුණ්ණ තෙරණුවන් |